**ශීර්ෂ 274 - අනුරාධපුරය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - පිළිබඳ විගණකාධිපති වාර්තාව 2014 වර්ෂය**

-----------------------------------------------------------------------------------------------------------

මෙම වාර්තාවේ 1 ඡේදයේ සිට 2 ඡේදය දක්වා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ වන ගිණුම් පිළිබඳ පොදු තොරතුරු ඇතුළත් කර ඇති අතර, 3 ඡේදයේ ශීර්ෂයට අදාළ විගණන නිරීක්ෂණ දැක්වේ.

**1. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ඇති ප්‍රාදේශීය ලේකම් කාර්යාල**

---------------------------------------------------------------------------

(අ) පදවිය

(ආ) කැබිතිගොල්ලෑව

(ඇ) මැදවච්චිය

(ඈ) රඹෑව

(ඉ) හොරොව්පොතාන

(ඊ) ගලෙන්බිඳුනුවැව

(උ) කහටගස්දිගිලිය

(ඌ) නැගෙනහිර නුවරගම් පළාත

(එ) නාච්චාදූව

(ඒ) මධ්‍යම නුවරගම් පළාත

(ඔ) නොච්චියාගම

(ඕ) මහවිලච්චිය

(ක) තලාව

(ග) තඹුත්තේගම

(ජ) රාජාංගනය

(ට) ගල්නෑව

(ඩ) ඉපලෝගම

(ණ) තිරප්පනේ

(ත) මිහින්තලේ

(ද) පලුගස්වැව

(න) කැකිරාව

(ප) පලාගල

**1.1 විගණන විෂය පථය**

---------------------

අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2015 අගෝස්තු 27 දින දිස්ත්‍රික් ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළහැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම.**

---------------------------------------------------------------------------------------------------

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්.**

-------

**2.1 විසර්ජන ගිණුම්**

-----------------

**(අ) මුළු ප්‍රතිපාදනය හා වියදම**

---------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.1,021,368,000 ක් වූ අතර, සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.1,016,727,744 ක්

උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.4,640,256 ක් හෙවත් සියයට 0.45 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| **වියදම** | **2014 දෙසැම්බර් 31 දිනට** | | | **ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|
| | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** | **ඉතිරිය** | |
| | රු. | රු. | රු. | |
| පුනරාවර්තන | 606,191,592 | 605,252,378 | 939,214 | 0.15 |
| මූලධන | 415,176,408 | 411,475,366 | 3,701,042 | 0.89 |
| **එකතුව** | **1,021,368,000** | **1,016,727,744** | **4,640,256** | **0.45** |

(ආ) **වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

විවිධ කාර්යයන් සඳහා වෙනත් අමාත්‍යාංශ 26 ක් හා දෙපාර්තමේන්තු 19 ක් විසින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත පිළිවෙලින් රු.3,886,278,903 ක් හා රු.2,096,102,529 ක් වශයෙන් එකතුව රු.5,982,381,432 ක ප්‍රතිපාදන සළසා තිබුණු අතර ඉන් පිළිවෙලින් රු.3,223,615,979 ක් හා රු.1,866,571,900 ක් වශයෙන් එකතුව රු.5,090,187,879 ක ප්‍රතිපාදන උපයෝජනය කර තිබුණි. ඒ අනුව සළසා තිබුණු ප්‍රතිපාදනයෙන් පිළිවෙලින් රු.662,662,924 ක් හා රු.229,530,629ක් වශයෙන් එකතුව රු.892,193,553 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

## 2.2 අත්තිකාරම් ගිණුම

**රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබූ සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 27401 | 49,000,000 | 48,850,519 | 35,000,000 | 38,177,458 | 200,000,000 | 167,640,932 |

**2.3 අග්‍රිම ගිණුම**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2014 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ගිණුමේ ශේෂය රු.5,038,774 ක් විය.

**2.4 පොදු තැන්පත් ගිණුම**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ඒ යටතේ වන ප්‍රාදේශීය ලේකම් කාර්යාල 22 ක 2014 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම්වල ශේෂ එකතුව රු.516,400,540 ක් විය.

**2.5 විගණන නිරීක්ෂණය.**

2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව අනුරාධපුරය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ 1.1 ඡේදයේ දක්වා ඇති පරිදි කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් නිරීක්ෂණ 3 ඡේදයේ දක්වා ඇත.

**3. ශීර්ෂ 274 - දිස්ත්‍රික් ලේකම් කාර්යාලය අනුරාධපුරය.**

**3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම.**

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

(අ) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් ස්ථාවර වත්කම් ලේඛන පිළියෙල කර නොතිබුණි.

(ආ) නියැදි පරීක්ෂාවට අනුව පහත සඳහන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් ඉදිරියෙන් සඳහන් කර ඇති ලේඛන පවත්වා නොතිබුණි.

| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | පවත්වා නොතිබුණු ලේඛන | අදාළ රෙගුලාසිය |
|---|---|---|
| මධ්‍යම නුවරගම් පළාත | පරිගණක උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/2 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| මැදවච්චිය | බැරකම් ලේඛනය | මුදල් රෙගුලාසි 214 |

**3.2 විසර්ජන ගිණුම**

**3.2.1 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදන**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විවිධ කාර්යයන් සඳහා අමාත්‍යාංශයක් හාවෙනත් අමාත්‍යාංශ 26 ක් හා දෙපාර්තමේන්තු දෙකක් විසින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත එකතුව රු. 143,169,621 ක ප්‍රතිපාදන සළසා තිබුණත්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් එම ප්‍රතිපාදනය රු. 2,844,383 කින් ඉක්මවා එකතුව රු.146,014,004 ක ප්‍රතිපාදන උපයෝජනය කර තිබුණි.

(ආ) අමාත්‍යාංශයක් විසින් එවා තිබුණු රු.29,000 ක ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් අදාල කාර්යයට උපයෝජනය නොකර මුළුමණින්ම ඉතිරි කර තිබුණි.

(ඇ) ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලබා දි තිබුණු මුලධන වියදම් සඳහා වන ප්‍රතිපාදනවලින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් රු.6,556,740 ක පුනරාවර්තන ස්වභාවයේ වියදම් වෙනුවෙන් උපයෝජනය කර තිබුණි.

**3.3 අග්‍රිම ගිණුම**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2014 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ගිණුමේ ශේෂය රු.626,108 ක් වූ අතර, ඉන් රු.210,872 ක් වූ ශේෂය 2010 වර්ෂයේ සිට පැවත එමින් තිබුණි.

**3.4 පොදු තැන්පත් ගිණුම**

ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 කට අයත් 2014 දෙසැම්බර් 31 දින වන විට වර්ෂ දෙකක කාලය ඉක්මවූ රු.1,104,797 ක් වූ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**3.5 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

විෂය අංක 27401 දරන රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2014 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟ හිට තිබුණු කේවල ශේෂ එකතුව රු.3,675,865 ක් වූ අතර, එම ණය ශේෂවලින් මාස 6 ක සිට වර්ෂ 7 ක් දක්වා කාලපරාසයක් ගතවී තිබුණත්, එම හිඟහිටි ණයශේෂ අයකර ගැනීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් කටයුතු කර නොතිබුණි.

**3.6 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

**3.6.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2004 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් ඉපලෝගම හා ගලෙන්බිඳුනුවැව ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් පිළියෙල කර නොතිබුණි.

**3.6.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම.**

අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක කිරිම සඳහා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය, වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දෙන ලද ප්‍රතිපාදන උපයෝජනය කිරිම සඳහා 2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව ප්‍රසම්පාදන සැලැස්මක් ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් පිළියෙල කර නොතිබුණි.

**3.7 වත්කම් කළමනාකරණය**

ප්‍රාදේශීය ලේකම් කාර්යාල සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(ඇ) **නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්.**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මැදවච්චිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ ප්‍රතිලාභීන් 6 දෙනෙකු සඳහා ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති යටතේ අදාළ නිර්ණායකයන්ට අනුකූල නොවන පරදි රු.487,900 ක් වැය කර මිලදී ගෙන තිබුණු උපකරණ විගණන පරික්ෂණ දිනය වූ 2015 මැයි 21 දින වන විටත් ජීවනෝපාය සංවර්ධන වැඩසටහන සඳහා යොදවා නොගෙන නිෂ්කාර්යව පැවැතිණි.

(ii) තිරප්පනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ දොරින් දොරට ගමින් ගමට සංවර්ධන වැඩසටහන යටතේ ප්‍රතිලාභින්ට බෙදාදීමට මිලදී ගත් රු.758,052 ක් වටිනා උපකරණ කට්ටල 362 ක් 2015 අප්‍රේල් 15 දින වන විටද ප්‍රතිලාභින් වෙත බෙදා නොහැර අදාළ ගබඩාවල රඳවාගෙන තිබුණි.

(iii) ඉකුත් වර්ෂවලදී ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය හා වෙනත් වැය ශීර්ෂවලින් ලද රජයේ අරමුදල් රු.10,700,300 ක් තිරප්පනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ව්‍යාපෘති 07 ක් සඳහා උපයෝජනය කර තිබුණි. එම ව්‍යාපෘති නිම කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී ද එම ව්‍යාපාති නිම කිරිමට අවශ්‍ය ප්‍රතිපාදන සළසා නොතිබිම නිසා ව්‍යාපාති 07 සඳහා උපයෝජනය කර තිබුණු රජයේ අරමුදල් තවදුරටත් නිෂ්කාර්ය වියදම් බවට පත්ව තිබුණි.

## 3.8 අනුකූල නොවීම්.

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරික්ෂණවලදී නිරික්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| මුදල් රෙගුලාසි 237(2) | ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ දොරින් දොරට ගමින් ගමට වැඩසටහන යටතේ දිස්ත්‍රික්කය තුළ |

ජීවනෝපාය ව්‍යාපෘති සඳහා භාණ්ඩ හා සේවා මිලදී ගැනීමට රු.333,974,496 ක චෙක්පත් ප්‍රතිලාභියාගේ නමට ලියා, ඉන් රු.204,069,522 ක චෙක්පත් ප්‍රතිලාභීන් වෙත මුදාහැර තිබූ අතර, රු.129,904,974 ක් වටිනා චෙක්පත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල තුළ රඳවාගෙන තිබුණි.

**(ආ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය**

**------------------------------------------**

**3.2 මාර්ගෝපදේශය**

(i). රුපියල් මිලියන 2 කට වැඩි ප්‍රසම්පාදනයන් ජාතික තරඟකාරී ලංසු කැඳවා කොන්ත්‍රාත්කරුවන් තෝරා ගැනීම වෙනුවට කැකිරාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ක්‍රියාත්මක කර තිබූ ඇස්තමේන්තු වටිනාකම රු.10,315,083 ක් වූ ජල ව්‍යාපෘති 3 ක් හා වාරිමාර්ග ව්‍යාපෘතියක් රුපියල් මිලියන 2 කට අඩුවන සේ ව්‍යාපෘති 06 කට කොටස් කර ඇස්තමේන්තුගත වටිනාකමට අනුමත සමිති වෙත පවරා තිබුණි.

(ii). ඇස්තමේන්තු ගත වටිනාකම රු.6,875,889 ක් රිටිගල පුරාවිද්‍යා ස්ථානයේ ප්‍රවේශ මාර්ග ඉදිකිරීම් ව්‍යාපෘතිය ජාතික තරඟකාරී ලංසු කැඳවීම වෙනුවට ඇස්තමේන්තුව කොටස් 3 කට වෙන්කර අනුමත සමිති 3කට රුපියල් මිලියන 2 ක් ඉක්මවා නොයන සේ ලබාදී තිබුණි.

**(ඇ) දිවිනැගුම අධ්‍යක්ෂ ජනරාල්ගේ 2014 සැප්තැම්බර් 30 දින දිවිනැගුම අංක 2014/15(1) චක්‍රලේඛය**

කැකිරාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සත්ත්ව පාලන ජීවනෝපාය ක්‍රම ක්‍රියාත්මක කිරීම සඳහා එක් ප්‍රතිලාභින් දෙදෙනෙකුට රු.50,000 ක් බැගින් රු.100,000 ක් වටිනා සතුන් ලබාදී තිබුණි. එම සතුන් මිලදී ගත් බව තහවුරු කෙරෙන බිල්පත්, පශු වෛද්‍ය වාර්තා හා අනන්‍යතාවය හඳුනා ගන්නා අංක සහිත ටෝකන් ඉදිරිපත් කිරිමට අපොහොසත් වීම නිසා එම ව්‍යාපෘතියේ සාර්ථකත්වය සනාථ කර ගැනිමට නොහැකි විය.

**3.9 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.**

-----------------------------

ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම්, ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම් හා ව්‍යාපෘති ප්‍රමාදයන් පිළිබඳව විගණන නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ අවස්ථා පහත දැක්වේ.

**(අ) ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම**

-------------------------------------------

ඇස්තමේන්තුගත පිරිවැය රු.21,517,053 ක් වූ ප්‍රාදේශිය ලේකම් කාර්යාල 10 ක ව්‍යාපෘති 45 ක් සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාත්මක නොකර අත්හැර තිබුණි.

**(ආ) ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම**

--------------------------------------

ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 කට අදාළ ඇස්තමේන්තුගත පිරිවැය රු.30,307,198 ක් වූ ව්‍යාපෘති 15 ක් සඳහා රු.2,249,033 ක් වැය කර තිබුණත්, සමාලෝචිත වර්ෂයේ එම ව්‍යාපෘති නිම නොකර අත්හැර තිබුණි.

**(ඇ) ප්‍රතිපාදන නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති**

-----------------------------------------------------------------------

2014 දෙසැම්බර් 31 දින වන විට අනුරාධපුර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 15 ක ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතිලාභීන් 8807 දෙනෙකු සඳහා ප්‍රතිලාභීන්ගේ නමින් ලියා අදාළ වැය විෂයයන්ට හර කර තිබූ රු.162,886,978 ක් වටිනා චෙක්පත්, ප්‍රතිලාභීන් වෙත නිකුත් කර නොතිබුණි. විධිමත් පරිදි ප්‍රතිලාභීන් හඳුනා නොගැනීම, අපේක්ෂිත භාණ්ඩ ලබා නොගැනීම, ප්‍රතිලාභී දායකත්වය ලබා නොදීම වැනි හේතූන් නිසා විගණන දිනය වූ 2015 මැයි 21 දින වන විටද එම ව්‍යාපෘති ක්‍රියාත්මක නොවී ඊට අදාළ චෙක්පත් අදාළ ප්‍රාදේශීය ලේකම්වරුන් භාරයේ පැවතුණි.

**(ඈ) ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දූර්වලතා.**

----------------------------------------

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

(i) මැදවච්චිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මැදවච්චිය නගරයේ සතිපොල සඳහා රු.8,648,070 ක වියදමින් පොල ගොඩනැගිල්ලක් සහ ආරක්ෂක වැට ඉදිකර තිබූ අතර, ඒ සඳහා අවශ්‍ය සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කර නොතිබුණි.

(ii) මැදවච්චිය නගරයේ ආදාහනාගාරය ඉදිකිරීම සඳහා මූලික ශක්‍යතා අධ්‍යයනයක් සිදු නොකර නගර මධ්‍යයේ පිහිටි ඉඩමක ආදාහනාගාරය ඉදිකිරීමට සැලසුම් කිරීම හේතුවෙන් මහජන විරෝධතා මත නවතා දැමීමට සිදුවීමෙන් ප්‍රදේශයේ ජනතාවට රු.10,552,972 ක ඉහත ව්‍යාපෘතිය අහිමි වී තිබුණි.

**(ඉ) භාණ්ඩ හා සේවා සැපයීම රහිතව මුදල් නිදහස් කිරීම.**

කැකිරාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ 2014 ප්‍රාදේශීය සංවර්ධන විමධ්‍යගත විශේෂ වැඩසටහන යටතේ මිලදී ගැනීම සඳහා සැපයුම්කාර ආයතන වෙත 2014 දෙසැම්බර් 31 දින වන විට ගෙවීම් කර තිබුණි. විගණන පරීක්ෂණ දිනය වූ 2015 අප්‍රේල් 22 දින වන විටත් අදාළ ප්‍රතිලාභින්ට හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගබඩාවට හෝ වෙනත් වගකිව යුතු ස්ථානයකට හෝ ලැබී නොතිබුණු භාණ්ඩවල වටිනාකම රු.2,644,070 ක් විය.

## 3.10 කාර්යසාධනය

2014 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**(අ) පොල්පැල 100,000 ක් බෙදා දීමේ ව්‍යාපෘතිය VI වන අදියර**

2014 වර්ෂයේදී අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ පොල්පැල 100,000 ක් සිටුවීමේ වැඩසටහන සඳහා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් රුපියල් මිලියන 10 ක් ලබාදී තිබුණි. දිස්ත්‍රික්කය තුළ පොල්පැල 40,000 ක් පමණක් බෙදා දී තිබූ අතර, ඒ පිළිබඳ කරන ලද නියැදි පරීක්ෂණයට අනුව තිරප්පනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඉලක්කගත පැල 5900 කින් සමාලෝචිත වර්ෂය තුළ පොල්පැල 1905 ක් පමණක් ලබාදී තිබුණි. ඉන් පැල 60 ක් පමණ ක්ෂේත්‍රයේ සිටුවීමට පෙර විනාශ වී තිබුණි. තිරප්පනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඉලක්කගත ප්‍රමාණයෙන් සියයට 31 ක පමණ ප්‍රගතියක් වූ අතර, දිස්ත්‍රික්කයේ එම ප්‍රතිශතය සියයට 40 ක් පමණ විය.

**(ආ) ධාන්‍ය චක්‍රීය අරමුදල**

2014 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව මගින් අනුරාධපුර දිස්ත්‍රික්කය සඳහා ධාන්‍ය චක්‍රීය අරමුදලක් පිහිටුවීම සඳහා රුපියල් මිලියන 300 ක ප්‍රතිපාදනයන් දිස්ත්‍රික් ලේකම් වෙත

ලබාදී තිබුණි. එය සමාලෝචිත වර්ෂයේ මුළු ප්‍රතිපාදනයම වියදමක් ලෙස අදාළ වැය විෂයයට හර කර තිබූ නමුත්, එම මුදලින් රු.61,976,460 ක් හෙවත් සියයට 21 ක ඉරිඟු මිලදී ගෙන ඔයාමඩුව ගබඩාවේ ගබඩා කර තිබුණි. ඉතිරි මුදලින් රු.11,813,305 ක් හෙවත් සියයට 5 ක් දැයට කිරුළ භූමියේ ඉදි කරන ලද වී ගබඩා 3 ක හිඟ බිල්පත් පියවීමට වැය කර තිබුණි. මෙම මුදලින් ඉතිරි සියයට 74 නිෂ්කාර්යව පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි.

**(ඇ) ගොවීන් හා තොග රැස්කරන්නන් සතු බඩඉරිඟු අස්වැන්න මිලදී ගැනීම.**

2014 ඔක්තෝබර් 10 දිනැති අංක DRD/Agri/Poultry/Maize දරන සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය මගින් රු.42 ක සහතික මිලට බඩඉරිඟු තොග මිලදී ගැනීම සඳහා අනුමැතිය ලබාදී තිබුණි. ගොවීන්ගේ අස්වැන්න සඳහා සාධාරණ සහතික මිලක් ලබාදීමේ අරමුණ ඇතිව ගොවීන්ගෙන් සහ තොග රැස්කරන්නන් සතු තොග මිලදී ගැනීම මෙම සහතික මිල නියම කිරීමට හේතුවී තිබුණි. ඒ අනුව තොග රැස්කරන්නන් හා ගොවීන්ගෙන් සාධාරණ මිලකට එම බඩඉරිඟු මිලදී ගත් බව සනාථ කර ගත යුතුව තිබුණි. එසේ නොකොට තොග වෙළෙන්දන් 7 දෙනෙකුගෙන් පමණක් ඉහත තොගය මිලදී ගෙන තිබුණි. එම වකවානුව තුළ ගොවීන් බඩ ඉරිඟු තොග කිලෝ එකක් රු.26-35 අතර මිලකට අළෙවි කර තිබුණු බව ගොවි කටයුතු හා පර්යේෂණ ආයතනයේ දත්ත අනුව සනාථ විය. ඒ අනුව, බඩ ඉරිඟු සඳහා සහතික මිලක් නියම කිරීම මගින් අපේක්ෂා කළ අරමුණු ඉටු වී නොතිබුණි.

**(ඇ) සතිපොල සංවර්ධන ව්‍යාපෘතිය**

ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ දොරින් දොරට ගමින් ගමට සංවර්ධන වැඩසටහන 2014 යටතේ සති පොලවල් 14 ක් ඉදිකිරීම සඳහා අනුරාධපුර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 12 ක් වෙනුවෙන් රු.122,850,000 ක ප්‍රතිපාදන සළසා තිබුණි. 2015 ජූලි 22 දින වන විට රු.26,001,761 ක් වැය කර තිබුණු නමුත්, ව්‍යාපෘතියේ ප්‍රගතිය අඩු මට්ටමක පැවතුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2014 වර්යේදි මෙම සති පොලවල් 14 කින් පදවිය හා ගලෙන්බිඳුනුවැව සතිපොලවල් දෙකෙහි පමණක් වැඩ අවසන් කර තිබූ අතර, ඇස්තමේන්තුගත වටිනාකම රු.118,000,000 ක් වූ ඉතිරි සතිපොලවල් 12 හි වැඩ අවසන් කර නොතිබුණි.

(ii) වැඩ අවසන් කර නොතිබුණු ව්‍යාපෘති 12 ක් වෙනුවෙන් රු.21,292,981 ක් වැය කර තිබූ අතර, දැරූ වියදම තුළින් සිදු කර තිබූ ඉදිකිරීම් නොනිමි තත්ත්වයේ පැවැතුණි. එම ඉදිකිරීම් සම්පූර්ණ කරන තෙක් එහි ප්‍රතිලාභ ජනතාව වෙත නොලැබෙන අතර, ව්‍යාපෘති සම්පූර්ණ කිරීම සඳහා 2015 ජුලි 22 දින වන විටත් කිසිදු සැලැස්මක් නොතිබුණි.

**(ඉ) ප්‍රතිලාභීන් වෙත ලබා නොදුන් ඉඩම් දීමනා පත්‍ර**

---------------------------------------------------

නියැදි පරීක්ෂණයට අනුව, ජනාධිපතිවරයා විසින් අත්සන් කර, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 ක් වෙත ලැබී තිබුණු ලියාපදිංචි කළ දීමනා පත්‍ර 579 ක් හා ලියාපදිංචි නොකළ දීමනා පත්‍ර 386 ක් වසර 01 ක සිට වසර 20 ක් දක්වා කාල පරාසයක් ගතවී තිබුණද, ප්‍රතිලාභීන් වෙත ලබා දීමට කටයුතු කර නොතිබුණි.

**(ඊ) ණය අයකර ගැනීමේ දුර්වලතා**

--------------------------------

ජීවනෝපාය සංවර්ධන වැඩසටහන යටතේ 2007 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා ප්‍රතිලාභීන්ගෙන් සියයට 50 ක් ණය අයකර ගැනීමේ පදනම මත ව්‍යාපෘති 21,303 ක් සඳහා ලබාදුන් රු.130,536,181 කින් 2014 දෙසැම්බර් 31 දින වන විට රු.22,132,755 ක් තවදුරටත් අයවීමට තිබුණි.

## 3.10 මතභේදයට තුඩු දෙන ගනුදෙනු.

---------------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් සිදු කර තිබුණු සමහර ගනුදෙනු මතභේදාත්මක ස්වරූපයේ ඒවා විය. නියැදි පරීක්ෂණවලදී තිරප්පනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ කෘෂි උපකරණ මිලදී ගැනීම සඳහා ප්‍රතිලාභීන් 600 ක් වෙත රු.5,000 බැගින් චෙක්පත් නිකුත් කිරීමට සැලැසුම් කර තිබූ අතර, ඔවුන් කොට්ඨාශය තුළ කෘෂි කර්මාන්තයේ යෙදෙන්නන් බව හඳුනාගැනීමකින් තොරව චෙක්පත් ලියා තිබූ අතර, නියැදි පරීක්ෂණයට අනුව ග්‍රාම නිලධාරී තුලාන 04 ක පදිංචි සියළු පවුල් ඒකක සඳහා රු.5,000 ක් බැගින් චෙක්පත් ලියා තිබුණි.

## 3.11 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-------------------------------

සමාලෝචිත වර්ෂයේදි රු.8,390,803 ක් වැය කර පාරම්පරික වී මිලදී ගැනීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර තිබුණි. එම කාර්යය සඳහා පරිපාලන වියදම් වශයෙන් රු.3,235,684 ක් හෙවත් වී

මිලදී ගැනිම සඳහා වැය කර තිබුණු වියදමෙන් එය සියයට 38.5 ක් වැනි ඉහළ ප්‍රමාණයක් වී තිබුණි. එය කළමනාකරණ අකාර්යක්ෂමතාවයක් වශයෙන් නිරීක්ෂණය විය.

**3.12 කළමනාකරණ දුර්වලතා**

**-----------------------------**

**ගිනි අවි බලපත්‍ර ලබාගැනීම් පැහැර හැරීම.**

**---------------------------------------------------**

අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ 2014 දෙසැම්බර් 31 දින වන විට නිකුත් කර තිබුණු ගිනි අවි බලපත්‍ර 1920 ක් වි තිබුණි. එම දින වන විට බලපත්‍ර ලබාගැනීම් පැහැර හැර තිබූ ගිනිඅවි 181 ක් පැවැති අතර එම ගිනි අවි දිගු කාලයක සිට බලපත්‍ර අළුත් කර ගෙන නොතිබුණි. දිස්ත්‍රික් ලේකම් විසින් මෙලෙස දිගුකාලීනව බලපත්‍ර අළුත් කිරිම පැහැර හැරීමට ලක්වන බලපත්‍රලාභීන් පිළිබඳව විධිමත් සොයාබැලීමක් කර නිසි පරිදි බලපත්‍රලාභීන් යාවත්කාලීන කිරීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**3.13 මූල්‍ය අක්‍රමිකතා ස්වරූපයේ ගනුදෙනු**

**------------------------------------------------**

කැකිරාව ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශය තුළ අවමංගල්‍යාධාර සමිති ශාලාවක් ඉදිකිරීම සඳහා අවශ්‍ය සෙවිලි තහඩු ප්‍රමාණය ඉක්මවා සෙවිලි තහඩු 69 ක් වෙනුවෙන් රු.156,975 ක් වැඩිපුර ගෙවා තිබුණි.

**3.14 මානව සම්පත් කළමනාකරණය**

**-----------------------------------**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

**----------------------------------------------------------**

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| **සේවක වර්ගය** | | **අනුමත සේවක සංඛ්‍යාව** | **තථ්‍ය සේවක සංඛ්‍යාව** | **පුරප්පාඩු සංඛ්‍යාව** | **අතිරික්ත සංඛ්‍යාව** |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 73 | 61 | 12 | -- |
| (ii) | තෘතීයික මට්ටම | 45 | 20 | 25 | -- |
| (iii) | ද්විතීයික මට්ටම | 1,331 | 1,071 | 260 | -- |
| (iv) | ප්‍රාථමික මට්ටම | 1,682 | 1,361 | 329 | 8 |
| | **එකතුව** | **3,131** | **2,513** | **626** | **8** |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කාර්ය මණ්ඩල උපයෝජනය පිළිබඳ සිදු කරන ලද සෝදිසි පරීක්ෂාවේදී ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරීන් 12 දෙනෙකුගේද, තෘතීයික මට්ටමේ නිලධාරීන් 25 දෙනෙකුගේද, ද්විතීයක මට්ටමේ නිලධාරීන් 346 දෙනෙකුගේද, ප්‍රාථමික මට්ටමේ නිලධාරීන් 407 දෙනෙකුගේද පුරප්පාඩු පැවැතුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානය වන විට ඉහත දක්වා ඇති පුරප්පාඩු 790 පිරවීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් කටයුතු කර නොතිබුණි.